**අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - 2017**

---

අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 3008 එස්ආර්අයි සාමාන්‍ය මෙහෙයුම් හා අංක 3009 එස්ආර්අයි විශේෂ මෙහෙයුම් ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ණය ගිවිසුම් අනුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වැඩසටහනේ කටයුතු ජාතික මට්ටමෙන් ද, පළාත් සභා මගින් පළාත් මට්ටමෙන් ද කරගෙන යාමට අපේක්ෂිතය. මෙම වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ජාතික මට්ටමෙන් කරන ලද කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම්වලින් සමන්විතය.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණ, අරමුදල් යෙදවීම හා කාලසීමාව

---

ණය ගිවිසුම්වලට අනුව, රටේ සාමාන්‍ය අධ්‍යාපන අංශය මුහුණපාන අභියෝග භාර ගැනෙන 2013 – 2017 අධ්‍යාපන අංශ සංවර්ධන රාමුව සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය සහාය ලබාදීම සඳහා අධ්‍යාපන අංශ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශය අධ්‍යාපන අංශ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයට ප්‍රවේශවීම එක සමාන ලෙස වැඩි දියුණු කිරීම, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා අධ්‍යාපනයෙන් සපයන පාලන හා සේවා ශක්තිමත් කිරීම වැඩසටහනේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහන සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 200 කට සමාන රු.මිලියන 26,000 ක් වේ. වැඩසටහනේ කටයුතු 2013 අගෝස්තු 23 දින ආරම්භ කරන ලද අතර 2018 අගෝස්තු 31 දින වන විට නිමකිරීමට නියමිතය.

## 1.3 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව, උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දක්වා ඇති වියදම් වැඩසටහන විසින් පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන අරමුදල්වලින් දරන ලද අධ්‍යාපන අංශයෙහි මධ්‍යගත ආයතන තුනෙහි වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ අධ්‍යාපන අංශයේ මධ්‍යගත ආයතන තුනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 හා 2017 ඔක්තෝබර් 16 දිනැති අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) ආසියානු සංවර්ධන බැංකුව සඳහා පිළිගත හැකි ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) තැන්පත් ගිණුමේ ආරම්භක හා අවසන් ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම්, මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(එ) මාගේ ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සැහීමට පත්විය හැකි ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව. සහ

(ඒ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 විගණන මතය

-----------------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2017 ඔක්තෝබර් 16 දිනැති අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල වන පරිදි 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ ශීර්ෂ අංක 126 දරණ අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ 2017 වර්ෂය සඳහා විසර්ජන ගිණුම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබූ බව, ඉහත ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව භාණ්ඩාගාරයේ පරිගණක මුද්‍රිත සටහන් සහ වාර්ෂික ඇස්තමේන්තු සහ අධ්‍යාපන අංශයේ මධ්‍යම ආයතන තුන විසින් නඩත්තු කරනු ලැබූ පොත්පත් හා වාර්තා සමඟ එකඟ වූ බව,

(ආ) තැන්පතු ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල එම ගිණුමෙන් ආපසුගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් මහා භාණ්ඩාගාරය විසින් පවත්වා තිබුණු පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ ඉකුත් වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සැහීමට පත්විය හැකි ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත් ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

------------------------------------------

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන චක්‍රලේඛය අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 මැයි 30 දින දීය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ ඇතැම් වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| ප්‍රභවය | ගිවිසුමේ මූල්‍ය මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු වේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසියානු සංවර්ධන බැංකුව | 200 | 26,000 | 4,880 | 26.60 | 2,619.29 | 98.93 | 13,342.81 |
| | 200 | 26,000 | 4,880 | 26.60 | 2,619.29 | 98.93 | 13,342.81 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන සඳහා රු. මිලියන 26,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 200 ක් මුළුමනින් වෙන්කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 4 ක් ගතවී තිබුණි. ශ්‍රී ලංකා රජයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට එ.ජ.ඩො. මිලියන 167 ක් හෙවත් රු. මිලියන 21,710 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ව්‍යාපෘතියට අදාළ කටයුතු වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දින දක්වා වැයකර තිබුණු මුළු මුදල එ.ජ.ඩො. 98.93 ක් හෙවත් රු.මිලියන 13,342.81 ක් පමණක් විය.

**(ආ)** රේඛීය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව, රේඛීය අමාත්‍යාංශයේ මූලධන වියදම් දැරීම සඳහා රු. මිලියන 52,577 ක වෙන්කිරීම් සිදුකර තිබුණු අතර, ඉන් සියයට 47 ක් නියෝජනය කරන රු. මිලියන 24,954 ක් 2017 දෙසැම්බර් 31 දිනට වැය නොකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහනේ ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා රු. මිලියන 4,880 ක් වෙන්කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු. මිලියන 2,261 ක් වැයකර නොතිබුණි. ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර තිබුණු රු. මිලියන 1,700 කින් තාක්ෂණ විද්‍යා විෂය ධාරාවේ විෂය නිර්දේශවල වෙනස්කම් හා ඊට අදාලව ලංසු අවලංගු කිරීම හේතුවෙන් රු. මිලියන 591.84 ක් පමණක් අදාල අවශ්‍යතාවය වෙනුවෙන් උපයෝජනය කර තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

## 3.2 භෞතික ප්‍රගතිය

--------------------

වැඩසටහනේ ලේඛන අනුව, අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන දිවයිනේ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට පවතින අනාගත අභියෝගවලට මුහුණදීම සඳහා වියපැහැදම් කිරීම හා සබැඳි ප්‍රතිඵල හා ඒ සම්බන්ධ ප්‍රධාන දර්ශක 09 ක් යටතේ ලඟා කරගත යුතු ඉලක්ක හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා අදාළ වියපැහැදම් හා සබැඳි ප්‍රතිඵලවල ඉලක්ක ලඟා කරගැනීම් පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට ජාතික පාසැල් 196 ක් ඇතුළුව අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය ක්‍රියාත්මක වන පාසැල් 380 ක් තිබුණි. කෙසේ වෙතත්, තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් බඳවාගෙන නොතිබුණු අතර, තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා පුරවා නොතිබුණු මුළු ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 257 ක් වී තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජාතික පාසැල් 353 න් 259 කම විදුහල්පති තනතුරු පුරප්පාඩු වී තිබුණු අතර, වැඩ ආවරණය කිරීම සඳහා වෙනත් වැඩබලන නිලධාරීන් පත්කර තිබුණි. 2017 පාසැල් සංඛ්‍යා ලේඛන වාර්තාව අනුව, මුළු පාසැල් සංඛ්‍යාවෙන් සියයට 3.5 ක් නියෝජනය කරන ජාතික පාසැල් 353 ක්ද ඇතුලත්ව දිවයිනේ පවතින මුළු පාසැල් සංඛ්‍යාව 10,194 ක් විය. කෙසේ වෙතත්, සිසු ජනගහනයෙන් සියයට 19.50 ක් නියෝජනය කරන සිසුන් 811,164 ක් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික පාසැල්වලට ඇතුළත්ව තිබුණ අතර, ගුරු ජනගහනයෙන් සියයට 15.80 ක් හෙවත් ගුරුවරු 38,242 ක් ජාතික පාසැල්වලට අනුයුක්ත කර තිබුණි.

(ඇ) වැඩසටහනේ ලේඛන අනුව දිවයින පුරා තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා තාක්ෂණ විද්‍යාපීඨ ගොඩනැගිලි 250 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් ගොඩනැගිලි 246 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කර තිබුණි. එම පාසැල්වල ඉඩකඩ නොතිබීම හේතුවෙන් කොළඹ 10 ගෝතමී බාලිකා විද්‍යාලයේ සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, මහනුවර අනුරුද්ධ කුමාර ජාතික පාසැලේ හා හොල්බෲක් දෙමළ විද්‍යාලයේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරුවන්ගේ අඩුපාඩු හේතුවෙන් අතරමඟ නතර කර තිබුණි.